# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1774/15 - 2012 සැප්තැම්බර් 05 වැනි බදාදා - 2012.09.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## අවසාන නියෝග

### ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත

### නිරවුල් කිරීමේ ආඥාව අංක 1877 (කුරුණෑගල)

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිලිහත්පත්තුවේ බස්නාහිර තිරගන්දහයේ කෝරලයේ හෙරලියවල නැමැති ගමේ පිහිටියා වූද අංක ඒ 657 දරණ මුල් සැලැස්මේ පිහිටියා වූ අංක 10 දරණ බිම් කට්ටිය වශයෙන් විස්තරකොට දැක්වෙන ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතේ 4වන වගන්තිය යටතේ නිරවුල් කිරීමේ දැන්වීමක් 1955 ඔක්තෝම්බර් මස 07 වැනි දින අංක 10847 දරණ රජයේ ගැසට් පත්‍රයේ (අංක 3071 (කුරුණෑගල) දරණ නිරවුල් කිරීමේ දැන්වීම බලනු) සහ ඉහත කී වගන්තියෙන් නියමිත අන්අයුරින් ද නිසි පරිදි ප්‍රසිද්ධ කරනු ලැබූ හෙයින් ද :

එසේම එකී දැන්වීම අනුව භාරගනු ලැබූ අයිතිවාසිකම් පිළිබඳව එකී ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර තිබෙන හෙයින් ද :

මෙහි පහත අත්සන් කරන මම එකී ආඥා පනතේ 5(5) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ඉඩම් හෝ ඒවායේ කොටස් මේ ආඥාවේ උපලේඛනයෙහි නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති පරිදි නිරවුල් කරනු ලබන බවට ආඥාවක් මෙයින් නිකුත් කර සිටිමි.

**පී. එම්. එච්. ප්‍රියදර්ශනී**
**නිරවුල් කිරීමේ සහකාර නිලධාරී**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්.

2012 අප්‍රේල් මස 19 වැනි දින,
බත්තරමුල්ල,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| බිම් කට්ටි අංකය | අනු බිම් කට්ටි අංකය | ප්‍රමාණය අ. | රූ. | ප. | පිඹුරු පත්‍රයේ අංකය | නිරවුල් කළේ කවර උප වගන්තිය යටතේද යනවග | නිරවුල් කොට දෙන ලද්දේ කවුරුන්ට ද යන වග | වෙනත් කරුණු (කොටස්, සම්බන්ධකම්, බැඳීම්, අධිකරණයට ඉදිරිපත්කර ඇති නඩුවල අංක, යනාදිය) | ඉඩම් ලියාපදිංචි කරන ලද ලියාපදිංචි කිරීමේ කාර්යාලය | වෙළුම් අංකය | පත්ඉරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | | 4 | 0 | 38 | _ | 5(1) | රජය සතුයි | _ | _ | _ | _ |

09-557/1

---

## අවසාන නියෝග

## ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත

# නිරවුල් කිරීමේ ආඥාව අංක 1831 (කුරුණෑගල)

## සංශෝධනය කිරීම

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නැගෙනහිර හතලිස් පහ කෝරලේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ (දැනට ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ), ඉහල ඇඹෝගම (දැනට රත්න දිවුල්වැව) ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ගල්කඩවල ගම (ගම් සිතියම් අංක 3871) සඳහා ප්‍රසිද්ධ කරන ලද අංක 5496 (කුරුණෑගල) දරණ නිරවුල් කිරීමේ දැන්වීම අනුව 2010.06.28 දිනැති අංක 1660/14 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ III වැනි කොටස ඉඩම් යටතේ පළවූ ඉඩම් නිරවුල් කිරීමේ අවසාන නියෝගයෙහි පහත සංශෝධනය සිදුකරනු ලැබේ.

මෙම ගැසට් පත්‍රයේ බිම්කට්ටි අංක 22 හි සඳහන් නිරවුල් කර ඇති 2 වන හිමිකරුගේ නම ගණිතරත්න බන්ජනයලාගේ ලේනාගේ මාටින් යන්න ගණිතරත්න බන්ජනයලාගේ පේමාගේ මාටින් ලෙස නිවැරිදි විය යුතුය.

**පී. එම්. එච්. ප්‍රියදර්ශනී**
**නිරවුල් කිරීමේ සහකාර නිලධාරී**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමාරිස්

2012 අගෝස්තු මස 29 වැනි දින,
බත්තරමුල්ල,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

09-557/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.